Institute of Certified Management Accountants of Sri Lanka

Incorporated by Parliament Act No.23 of 2009

අදර්ශ ප්‍රශ්න පත්‍රය

Certified Accounting Technologist

CAT 3: ආථර්ක විද්‍යාව සහ කළමනාකරණය (EM)

තොරතුරු:

1. **අනුමත කාලය**:

   කියවීම– මිනිත්තු 15.

   ලිවීම - පැය 3 යි.

2. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.
3. මෙහි පිටු 09 කින් සමන්විත වේ.

උපදෙස්:

4. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ.සෑම අංශයක්ම ආථර්ක විද්‍යාව සහ කළමනාකරණය ලෙස කොටස් දෙකකින් යුක්ත වේ.

   I කොටස: බහුවරණ ප්‍රශ්න (MCQs) 24 කි.

   II කොටස: ප්‍රශ්න අංක 01 - 02 (අනිවාර්‍ය ප්‍රශ්න)

   III කොටස: ප්‍රශ්න අංක 03 – 06) (සෑම කොටසකින්ම ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතුය.)

5. 1 කොටස හා II කොටස ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
6. සිංහල භාෂාවෙන් පමණක් පිළිතුරු සපයන්න.
7. වැඩසටහන්ගත නොකළ ගණක යන්ත්‍ර පමණක් භාවිතා කිරීමට අවසර ඇත.

පිළිතුරු සුවිය 10-14 පිටුවේ දක්වා ඇත.

I කොටස

විභාග ව්‍යුහය

- බහුවරණ ප්‍රශ්න(MCQ) 25 කි

  ආර්ථික විද්‍යාව -12 MCQs

  කළමනාකරණය - 12 MCQs

- එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 48 කි.

ආර්ථික විද්‍යාව

1) ලද පුද්ගලයන්ගේ ආර්ථික හැසිරීම් සහ තීරණ ගැනීම අධ්‍යයනය කිරීම

a) සාර්ව ආර්ථික විද්‍යාව
b) ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව
c) ව්‍යාපාර ආර්ථික විද්‍යාව
d) කළමනාකරණ ආර්ථික විද්‍යාව

2) මූලික ආර්ථික ප්‍රශ්න තුන සඳහා තීරණ ඉල්ලුම් හා සැපයුම් නිදහස් වෙළඳපළ බලවේග මඟින් හා රජය යන අංශ දෙකෙහිම මැදිහත්වීම දක්නට ලැබෙන්නේ මින් කුමන ආර්ථික පද්ධතිය තුලද?

a) වෙළඳපළ ආර්ථිකය
b) සැලසුම් කළ ආර්ථිකය
c) මිශ්‍ර ආර්ථිකය
d) නිදහස් ආර්ථිකය

3) ඉල්ලුම වක්‍රය දකුණට විතැන් වීමට හේතු වන්නේ:

a) නිෂ්පාදනයේ මිල අඩු වීම.
b) පාරිභෝගිකයින්ගේ ආදායම අඩු වීම.
c) අනුපූරක භාණ්ඩවල මිල අඩු වීම.
d) පාරිබෝගික රුචිය හා මනාපය අඩු වීම.

4) සැපයුම අඩු වීමට හේතු වන්නේ:

a) අමුද්‍රව්‍ය පිරිවැය අඩුවීම.
b) අහිතකර කාලගුණික තත්ත්වයන්.
c) පවතින නිෂ්පාදන තාක්ෂණය වැඩිදියුණු කිරීම.
d) අදාළ නිෂ්පාදනයේ මිල අඩු වීම.

5) වෙළඳපල සමතුලිතතා තත්ත්වයකදී:

a) ඉල්ලුම > සැපයුම
b) සැපයුම > ඉල්ලුම
c) ඉල්ලුම = සැපයුම
d) ඉල්ලුම ≠ සැපයුම

6) පහත පහත දැක්වෙනේ වෙළඳපලක ඉල්ලුම සහ සැපයුම නම් සමතුලිත මිල සහ ප්‍රමාණය කුමක්ද:

Qd = 40 - 2p

Qs = -30 + 3p

a) EP = 14, EQ = 12 b) EP = 12, EQ = 10

c) EP = 14, EQ = 18 d) EP = 10, EQ = 12

7) නිෂ්පාදනයේ "කෙටි කාලය" පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද:

a) සමාගමක/ ආයතනයක, ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය යන පිරිවැය වගර් දෙකම පැවතීම.

b) ආයතනයක විචල්‍ය පිරිවැය පමණක් පැවතීම.

c) කෙටිකාලයේදී ගනු ලබන නිෂ්පාදන තීරණ පරිමාණුකූල ඵල සම්බන්ධයෙන් සැලකිලිමත් වේ.

d) සමාගමක ස්ථාවර පිරිවැය පමණක් පැවතීම.

8) ආර්ථික විද්‍යාවේ ලාභය උපරිම කිරීමේ කොන්දේසිය වන්නේ:

a) MR < MC b) MR > MC c) MR ≠ MC d) MR = MC

9) පරිපූර්ණ තරහකාරී වෙළඳපල ව්‍යුහයේ ලක්ෂණයක් නොවන්නේ කුමක්ද:

a) සමාගම් සමජාතීය නිෂ්පාදන ඉදිරිපත් කරයි.

b) ඇතුල්වීම සහ පිටවීම සඳහා බාධක පැවතීම.

c) දිගු කාලීනව සුපිරි සාමාන්‍ය ලාභයක් ලබා ගැනීම.

d) සමාගම් මිල ගන්නන් වේ.

10) "බිඳුණු" (kinked) ඉල්ලුම් වක්‍රයක් ඇති ආයතනයක් අයත් වන්නේ මින් කුමන වෙළඳපල ව්‍යුහ යටද:

a) පූර්ණ තරඟකාරී b) ඒකාධිකාරී තරඟය

c) ඔලිගොපොල d) ඒකාධිකාරී

11) ව්‍යාපාර චක්‍රයක කුමන අදියරයේදී නිමැවුමේ අඩුවීම සහ විරැකියාව වැඩි වීම පැහැදිලි කරයි ද:

a) උච්ච b) අවපාතය

c) පතුලත d) ප්‍රතිසාධනය (වධර්නය)

12) රටක ජාතික ආදායම ගණනය කිරීමේ ක්‍රමයක් නොවන්නේ කුමක්ද:

a) ආදායම් ක්‍රමය b) වියදම් ක්‍රමය

c) නිෂ්පාදන/ ප්‍රතිදාන ක්‍රමය d) මිශ්‍ර ක්‍රමය

කළමනාකරණය

13) Peter F. Druckerට අනුව කාර්යක්ෂමතාව යනු:

a) නිවැරදි දේ කිරීම
b) ඊළඟ දේ කිරීම
c) කායර්න් නිවැරදිව කිරීම
d) පරිපූර්ණ දේ කිරීම

14) සංවිධානයක අභ්‍යන්තර පරිසරයට අයත් නොවන අංගය කුමක්ද:

a) සේවකයින්
b) අයිතිකරුවන්
c) සැපයුම්කරුවන්
d) සංවිධාන සංස්කෘතිය

15) Robert L. Katzට අනුව ඉහළ කළමනාකාරිත්වය සඳහා වඩා වැදගත් වන කළමනාකරණ කුසලතාව කුමක්ද:

a) තීරණ ගැනීමේ කුසලතා
b) සංකල්පීය කුසලතා
c) මානව කුසලතා
d) තාක්ෂණික කුසලතා

16) SMART ආකෘතිය මත පදනම්ව උපාය මාර්ගික අරමුණු වර්ධනය කර ඇත. පහත සඳහන් අංග වලින් ඉහත ආකෘතිය මත පදනම් නොවන්නේ කුමක්ද:

a) නිශ්චිත බව
b) මැනිය හැකි බව
c) අදාළ බව
d) ක්‍රියාකාරී බව

17) විධාන දාමය යනුවෙන් හඳුන්වන්නේ:

a) එක් එක් සේවකයා ඉහළ කළමනාකාරිත්වය සමඟ සම්බන්ධ කළ නොබිඳුණු අධිකාරී රේඛාව.
b) සේවකයෙකුට එක් අධීක්ෂකවරයෙකුගෙන් නියෝග ලැබීම.
c) එක් පුද්ගලයෙකුට සෘජුවම වාර්තා කරන සේවක සංඛ්‍යාව.
d) ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුද්ගලයන් ඒකකවලට සහ ඒකක දෙපාර්තමේන්තුවලට කාණ්ඩායම්ගත කිරීම.

18) කළමනාකරුට ඔහුගේ / ඇයගේ විශේෂ දැනුම නිසා භාවිතා කළ හැකි බල මූලාශ්‍රය කුමක්ද

a) තනතුරු බලය
b) විශේෂඥ බලය
c) යොමු බලය
d) බලහත්කාර බලය

19) නායකත්වයේ අවිනිශ්චිත න්‍යාය යන්නෙන් අදහස් කෙරෙන්නේ:

a) නායකත්වය විවිධ තත්වයන් මත රඳා පවතී.
b) පුද්ගල නැඹුරුතාව මත රඳා පවතින නායකත්වය, කාර්යය නැඹුරුතාවයි.
c) කාර්යය නැඹුරුතාව මත රඳා පවතින නායකත්වය, පුද්ගල නැඹුරුතාවයි.
d) නායකත්වය රඳා පවතින්නේ පුද්ගලයාගේ උපන් ගති ලක්ෂණ මතය.

20) Fredrick Hertzberg විසින් හඳුනා ගන්නා ලද සනීපාරක්ෂක සාධකයක් වන්නේ:

a) ජයග්‍රහණ b) වැටුප c) පිළිගැනීම d) වගකීම්

21) මෙහෙයුම් පාලන වලදී, අපගමනයන් හඳුනාගෙන ඒවා සිදුවීමට පෙර වැළැක්වීම හඳුන්වන්නේ:

a) සහගාමී පාලනය b) පසු පෝෂණ පාලනය

c) ප්‍රතිපෝෂණ පාලනය d) අඛණ්ඩ පාලන ක්‍රම

22) පහත සඳහන් දේවලින් ආයතනික පාලනයේ මූලධර්මයක් නොවන්නේ කුමක්ද:

a) විනිවිදභාවය b) වගකිව යුතු බව

c) ආචාර ධර්ම d) විවෘතභාවය

23) තිරසාර සංවර්ධනයේ අංගයක් නොවන්නේ කුමක්ද:

a) ආර්ථිකය b) පරිසරය c) සමාජය d) සංවිධාන

24) වෝහාරික විගණනය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද:

a) ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය සහ සාධාරණත්වය පරීක්ෂා කිරීම.

b) අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලනයේ සඵලතාවය පිළිබඳ සහතික කිරීම.

c) නීති විරෝධී ක්‍රියාකාරකම්වලට සම්බන්ධ සංවිධාන විමර්ශනය කිරීම.

d) විශේෂිත නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම නිරීක්ෂණය කිරීමේ පරීක්ෂාව

[MCQ 24 x ලකුණු 2 බැගින් -මුළු ලකුණු 48]

II කොටස – (අනිවාර්‍ය ප්‍රශ්න)

විභාග ව්‍යුහය

- සිද්ධි පාදකකරගත් ප්‍රශ්න 02 කි.

  ආර්ථික විද්‍යාව -ප්‍රශ්න 01 කි

  කළමනාකරණය -ප්‍රශ්න 01 කි

  - එකකට ලකුණු 16 බැගින් මුළු ලකුණු 32 කි.
  - ප්‍රශ්න දෙකටම පිළිතුරු සැපයීම අනිවාර්‍ය වේ

ආර්ථික විද්‍යාව

01 ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ කෘෂිකාමර්මිකඅංශය බාහිර පාරිසරික සාධකවලට බෙහෙවින් ගොදුරු වේ. 2022 දී රසායනික පොහොර ආනයනය තහනම් කිරීමට රජය ගත් තීරණය කෘෂිකාර්මික නිෂ්පාදනය අඩුවීමට හේතු විය. මීට අමතරව, වසරේ අවසාන මාස කිහිපය තුළ දැඩි වර්ෂාපතනය ඇතුළු කාලගුණික තත්ත්වයන් අස්වැන්න කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. කෘෂිකාර්මික කම්කරුවන්ගේ ඉහළ අවම වැටුප් සඳහා පවත්නා අඛණ්ඩ ඉල්ලීම් ල කෘෂිකාර්මික නිෂ්පාදනය පහත වැටීමට තවදුරටත් දායක වී තිබේ.

ඔබ විසින් කළ යුත්තේ:

1.1. අහිතකර බාහිර සිදුවීම් හේතුවෙන් කෘෂිකාමර්මික ඉඩම්වලට සිදුවන හානිය PPC භාවිතයෙන් නිදශර්නය කරන්න.

(ලකුණු 02)

1.2. ඉහත තත්ත්වය මත පදනම්ව සැපයුම වෙනස් වීමට හේතු තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

1.3. කෘෂිකාමර්මික නිෂ්පාදනවල ලක්ෂණ මත පදනම්වල කෘෂිකාමර්මික අංශය සඳහා වඩාත් සුදුසු වෙළඳපල ව්‍යුහය කුමක්ද.

(ලකුණු 03)

1.4. කෘෂිකාර්මිකඋ අංශයේ ව්‍යාපාර මිල සාදන්නන් වේ" ඔබ එකඟද? පැහැදිලි කරන්න

(ලකුණු 05)

[මුළු ලකුණු 16]

කළමනාකරණය

02 ප්‍රශ්නය

සිල්වා මහතා ශ්‍රී ලංකාවේ විශාලතම සංස්ථාවක් වන ABC PLC හි සමූහ සාමාන්‍යාධිකාරීවරයා ලෙස අලුතින් පත් කර ඇත. ABC PLC හි කළමනාකාරිත්වයට ඉතා හොඳ පළපුරුද්දක් ඇති අතර මූල්‍ය, අලෙවිකරණය, තොරතුරු තාක්ෂණ, මානව සම්පත් සහ නිෂ්පාදන යන ක්ෂේස්ත්‍ර වල ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ඔහුට සෘජුවම වාර්තා කරයි. සංවිධානයේ පහළම මට්ටම ඉහත විශේෂිත ක්ෂේත්‍රවල නැවුම් උපාධිධාරීන් වන විධායක නිලධාරීන්ගෙන් සමන්විත වේ.

ඔබ විසින් කළ යුත්තේ:

2.1. මෙම ආයතනයේ සාර්ථක කළමනාකරුවෙකු වීමට සිල්වා මහතාට වඩාත්ම අවශ්‍ය කළමණාකරණ කුසලතාව කුමක්ද? පැහැදිලි කරන්න.

(ලකුණු 03)

2.2. *සිල්වා මහතා සංවිධානයේ ඉහළ කළමනාකාරිත්වයට අයත් වන බැවින්, ඔහුට සංවිධානයේ අනාගතය කල්තියා දැකීමට හැකි වන පරිදි සංකල්පමය කුසලතාව අවශ්‍ය වේ.*
ABC PLC හි සංවිධාන ව්‍යුහය නිරූපනය කරන්න.

(ලකුණු 03)

2.3. සිල්වා මහතා විසින් සංවිධානයේ විවිධ කළමනාකරණ මට්ටම් සමඟ පුද්ගල-නැඹුරු සහ කාර්යය-නැඹුරු නායකත්ව ශෛලීන් භාවිතා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

2.4. ආයතනයේ සේවක තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා නව අභිප්‍රේරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමට සිල්වා මහතා සැලසුම් කර ඇත. මෙම සංවිධානයට මැස්ලෝගේ අවශ්‍යතා ධුරාවලිය යොදාගැනීම පැහැදිලි කිරීමෙන් සිල්වා මහතාට උදවු කරන්න.

(ලකුණු 04)

[මුළු ලකුණු 16]

III කොටස – (තෝරාගත යුතු ප්‍රශ්න)

විභාග ව්‍යුහය

- ව්‍යුහගත ප්‍රශ්න හතරකි.
  - ආර්ථික විද්‍යාව -ප්‍රශ්න 02 කි
  - කළමනාකරණය -ප්‍රශ්න 02 කි
- සෑම කොටසකින්ම එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.
- එකකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 20කි.

ආර්ථික විද්‍යාව

03 ප්‍රශ්නය

ඔබ විසින් කළ යුත්තේ:

3.1 ආර්ථික විද්‍යාව පිළිබඳ පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න

i) හිඟකම

ii) තේරීම

iii) ආවස්ථික පිරිවැය

(ලකුණු 03)

3.2 නිෂ්පාදන ශක්‍යතා වක්‍රය (PPC) භාවිතයෙන් පහත ආර්ථික අවස්ථා නිරූපණය කරන්න

a) ශ්‍රී ලංකාවේ නව තෙල් සංචිත සොයා ගැනීම

b) කොළඹ ගංවතුර හේතුවෙන් වාණිජ ගොඩනැගිලි අහිමි වීම

c) රජයේ සේවකයන්ගේ අකාර්යක්ෂමතාව

(ලකුණු 03)

3.3 වෙළෙඳපොළ ආර්ථිකයන් මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 04)

[මුළු ලකුණු 10]

04 ප්‍රශ්නය

ඔබ විසින් කළ යුත්තේ:

4.1. TOYOTA වාහනවල ඉල්ලුමට බලපාන සාධක හතරක් ලැයිස්තුගත කරන්න.

(ලකුණු 02)

4.2. "නිෂ්පාදනයේ මිල අඩු වුවහොත් ඉල්ලුමේ වක්‍රය දකුණට විතැන් වනු ඇත" ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද: ඇයි:"

(ලකුණු 04)

4.3. වී අස්වැන්න සඳහා ඉල්ලුම් සහ සැපයුම් ශ්‍රිත පිළිවෙලින් සමීකරණ මගින් ලබා දී ඇත: Qd = 20 - 0.02p and Qs = - 12 + 0.06p. සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න.

(ලකුණු 04)

[මුළු ලකුණු 10]

කළමනාකරණය

05 ප්‍රශ්නය

ඔබ විසින් කළ යුත්තේ:

5.1. කළමනාකරුවන් සහ නායකයින් අතර වෙනස්කම් හඳුන්වන්න

(ලකුණු 02)

5.2. "බාහිර පරිසරයේ වෙනස්කම් වලට සංවිධාන අවදානමට ලක් වේ" සංවිධානයකට ඇති අවස්ථා සහ තර්ජන වල බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

5.3. කළමනාකරණ කුසලතා වල අවශ්‍යතාවය සංවිධානයක කළමනාකරණ මට්ටම් අනුව වෙනස් වේ. ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න

(ලකුණු 04)

[මුළු ලකුණු 10]

06 ප්‍රශ්නය

ඔබ විසින් කළ යුත්තේ:

6.1. සංවිධානයක "දැක්ම" නිර්වචනය කර දැක්මෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 03)

6.2. "නායකයන් තම අනුගාමිකයින්ට බලපෑම් කිරීමට විවිධ බල මූලාශ්‍ර භාවිතා කරයි"." එවැනි බල ප්‍රභවයන් කිහිපයක් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

6.3. "සැලසුම් කිරීම සහ පාලනය කිරීම ඕනෑම සංවිධානයක අන්තර් සම්බන්ධිතය වේ" ඔබ එකඟ වේද. පැහැදිලි කරන්න.

(ලකුණු 04)

[මුළු ලකුණු 10]

***

පිළිතුරු සුචිය

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	B	13	C
02	C	14	C
03	C	15	B
04	B	16	D
05	C	17	A
06	A	18	B
07	A	19	A
08	D	20	B
09	C	21	C
10	C	22	D
11	B	23	D
12	D	24	C

II කොටස

01 ප්‍රශ්නය

1.1 අහිතකර බාහිර සිදුවීම් හේතුවෙන් කෘෂිකාමර්ික ඉඩම්වලට සිදුවන හානිය PPC භාවිතයෙන් නිදශර්නය කරන්න.

නිශ්පාදන හැකියා මායිම් වක්‍ර (PPC) වමට විතැන් කළ යුතුය.

1.2 ඉහත තත්ත්වය මත පදනම්ව සැපයුම වෙනස් වීමට හේතු තුනක් පැහැදිලි කරන්න.

සැපයුමට බලපාන සාධක හා එම සාධක සැපයුමට බලපෑම් කරන ආකාරය හඳුනා ගත යුතුය.

I. *ශ්‍රී ලංකාවට රසායනික පොහොර ආනයනය තහනම් කිරීම - සැපයුම පහත වැටේ*

II. *අයහපත් කාලගුණික තත්ත්වයන් - අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සැපයුම පහත වැටේ.*

III. *කෘෂිකාමර්ික කමර්ාන්තයේ කම්කරුවන්ගේ අවම වැටුප් වැඩිවීම - නිෂ්පාදන පිරිවැය වැඩිවීම හේතුවෙන් සැපයුම පහත වැටේ.*

1.3 කෘෂිකාමරීක නිෂ්පාදනවල ලක්ෂණ මත පදනම්වල කෘෂිකාමරීක අංශය සඳහා වඩාත් සුදුසු වෙළඳපල ව්‍යුහය කුමක්ද

පූර්ණ තරඟකාරී වෙළඳපල ව්‍යුහය වඩාත් සුදුසු වෙළඳපල ව්‍යුහයයි.. එයට හේතුව වන්නේ වෙළඳපොළ ව්‍යුහයතුළ ආයතන සමජාතීය භාණ්ඩ සැපයීම, වෙළඳපළ තුල ආයතන විශාල සංඛයාවක් සිටීම හා වෙළඳපළ ව්‍යුහය තුල ආයතන මිල ගණුවන් ලෙස ක්‍රියා කිරීමයි.

1.4 "කෘෂිකාර්මිකය අංශයේ ව්‍යාපාර මිල සාදන්නන් වේ" ඔබ එකඟද. පැහැදිලි කරන්න

නැත, කෘෂිකාමරීක අංශයේ ව්‍යාපාර පූණර් තරහකාරී වෙළඳපල ව්‍යුහයට අයත් වන බැවින් ව්‍යාපාරය විශාල සංඛ්‍යාවක් නිසා අඩු වෙළඳපල බලයක් ප්‍රදශර්නය කරන අතර ඔවුන් වෙළඳපොළට ඉදිරිපත් කරන සමාන නිෂ්පාදන ඔවුන්ගේම මිල නියම කිරීමේ හැකියාව සීමා කරයි. ප්‍රධාන වශයෙන් සමාගම් විසින් ඉදිරිපත් කරන සමාන නිෂ්පාදන හේතුවෙන් සමාගම් සඳහා මිල නියම කිරීමට වෙළඳපල බල කරයි. එබැවින්, පූණර් තරහකාරී වෙළඳපල ව්‍යුහයේ (කෘෂිකාමරීක) සමාගම් මිල සාදන්නෙකුට වඩා මිල ගන්නන් වේ.

02 ප්‍රශ්නය

2.1 මෙම ආයතනයේ සාර්ථක කළමනාකරුවෙකු වීමට සිල්වා මහතාට වඩාත්ම අවශ්‍ය කළමණාකරණ කුසලතාව කුමක්ද. පැහැදිලි කරන්න.

සිල්වා මහතා සංවිධානයේ ඉහළ කළමනාකාරිත්වයට අයත් වන බැවින්, ඔහුට සංවිධානයේ අනාගතය කල්තියා දැකීමට හැකි වන පරිදි සංකල්පමය කුසලතාව අවශ්‍ය වේ.

2.2 ABC PLC හි සංවිධාන ව්‍යුහය නිරූපනය කරන්න.



2.3 සිල්වා මහතා විසින් සංවිධානයේ විවිධ කළමනාකරණ මට්ටම් සමඟ පුද්ගල-නැඹුරු සහ කාර්යය-නැඹුරු නායකත්ව ශෛලීන් භාවිතා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

සංවිධානයක මධ්‍යම මට්ටමේ සහ පහළ මට්ටමේ වැනි විවිධ මට්ටම් වල සේවකයින්ගෙන් සමන්විත වේ. එසේම සමහරක් සේවකයින් හොඳ පළපුරුද්දක් ඇති අය වන අතර ඇතැමුන් නව උපාධිධාරීන් වේ. එබැවින් සංවිධානය මෙහෙයවීම සඳහා විවිධ නායකත්ව ශෛලීන් යොදා ගැනීමට සිල්වා මහතාට සිදුවේ.

සිල්වා මහතාට පළපුරුදු මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සමඟ වැඩියෙන් පුද්ගල-නැඹුරු නායකත්ව ශෛලීන් භාවිතා කළ හැකි අතර එයට හේතුව වන්නේ එම කණ්ඩායමට අඩු මඟ පෙන්වීමක් සහ අධීක්ෂණයක් අවශ්‍ය වන බැවිනි. අඩු පළපුරුද්දක් සහ සමීප අධීක්ෂණයක් අවශ්‍ය බැවින් සිල්වා මහතාට පහළ මට්ටමේ සේවකයින් සමඟ වැඩියෙන් කාර්යය-නැඹුරු නායකත්ව ශෛලීන් භාවිතා කිරීමට හැකිය..

2.4 ආයතනයේ සේවක තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා නව අභිප්‍රේරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමට සිල්වා මහතා සැලසුම් කර ඇත. මෙම සංවිධානයට මැස්ලෝගේ අවශ්‍යතා ධුරාවලිය යොදාගැනීම පැහැදිලි කිරීමෙන් සිල්වා මහතාට උදව් කරන්න.

මාස්ලෝගේ අවශ්‍යතා ධුරාවලිය මගින් ආයතනයක සේවකයින්ගේ විවිධ මට්ටම්වල තෘප්තිමත් බව නිරීක්ෂණය කරයි. ඉහළ/මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සමාජ අවශ්‍යතා, ආත්ම අභිමානය අවශ්‍යතා හෝ ස්වයං-සාක්ෂාත් කර ගැනීමේ අවශ්‍යතා සපුරාලීම මගින් ඔවුන් තෘප්තිමත් කළ හැකි අතර පහළ මට්ටමේ කළමනාකරුවන් භෞතික සහ ආරක්ෂිත අවශ්‍යතා සපුරාලීම මගින් තෘප්තිමත් කළ හැකි. එයින් අදහස් වන්නේ ඉහළ/මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට සේවා ස්ථානයේ වඩා පිළිගැනීමක් ලබා ගැනීමට වඩා අභියෝගයන් සහ අවස්ථාවන් අවශ්‍ය බවයි. පහළ මට්ටමේ සේවකයින් හොඳ මූලික වැටුපකින්, රැකියාවේ අනෙකුත් මුල්‍ය ප්‍රතිලාභ/ දීමනා සහ රැකියා සුරක්ෂිතතාවයෙන් සෑහීමකට පත්වේ.

III කොටස

03 ප්‍රශ්නය

3.1 ආර්ථික විද්‍යාව පිළිබඳ පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න

- *හිඟකම - මිනිසාගේ අසීමිත අවශ්‍යතා හා සසඳන විට පවතින සම්පත් සීමිතය*
- *තේරීම - සම්පත් සීමිත සහ විකල්ප භාවිතයන් ඇති බැවින්, ආර්ථික ඒකක සියලු විකල්ප අතරින් හොඳම විකල්පය තෝරාගත යුතුය.*
- *ආවස්ථික පිරිවැය - ඊළඟ හොඳම විකල්පයේ පිරිවැයි.*

3.2 නිෂ්පාදන ශක්‍යතා වක්‍රය (PPC) භාවිතයෙන් පහත ආර්ථික අවස්ථා නිරූපණය කරන්න

a) ශ්‍රී ලංකාවේ නව තෙල් සංචිත සොයා ගැනීම - *PPC දකුණට විතැන් වේ.*

b) කොළඹ ගංවතුර හේතුවෙන් වාණිජ ගොඩනැගිලි අහිමි වීම - *PPC වමට විතැන් වේ.*

c) රජයේ සේවකයන්ගේ අකාර්යක්ෂමතාව. - *PPC ඇතුළත ලක්ෂ්‍යයක් වේ*

3.3 වෙළෙඳපොළ ආර්ථිකයන් මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආකාරය විස්තර කරන්න.

වෙළඳපල ආර්ථිකය තුළ සම්පත් බහුතරයක් පුද්ගලික අංශය සතු වන අතර ඔවුන්ගේ අභිප්‍රේරණය ලාභය වේ. එබැවින්, ඔවුන් ශ්‍රමයේ අවම පිරිවැය ප්‍රවේශය හෝ ප්‍රාග්ධන දිරිගැන්වීමේ ප්‍රවේශයන් භාවිතා කර මිලදී ගැනීමේ හැකියාව ඇති පුද්ගලයින් සඳහා ඉහළම ලාභදායිතාවයකින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි.

04 ප්‍රශ්නය

4.1 වාහනවල ඉල්ලුමට බලපාන සාධක හතරක් ලැයිස්තුගත කරන්න.

a) TOYOTA *වාහනවල මිල*
b) *වෙනත් වෙළඳ නාමවලින් යුත් වාහනවල මිල*
c) *පාරිභෝගිකයින්ගේ ආදායම*
d) *වාහන මිල පිළිබඳ අනාගත මිල අපේක්ෂාවන්*
e) TOYOTA *වාහන වල තාක්ෂණය*

4.2 "නිෂ්පාදනයේ මිල අඩු වුවහොත් ඉල්ලුමේ වක්‍රය දකුණට විතැන් වනු ඇත" ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඇයි?

නැත. ඉල්ලුම් වක්‍රය වෙනස් වන්නේ එම භාණ්ඩයේ මිල හැරල අනෙකුත් භාණ්ඩවල මිල ගණන්, පාරිභෝගිකයන්ගේ ආදායම, පාරිභෝගික රුචිය , තාක්ෂණය, ගුණාත්මකභාවය යනාදී අනෙකුත් සාධක වෙනස් වුවහොත් පමණි. භාණ්ඩයේ මිල වෙනස් වන විට ඉල්ලුම වක්‍රයේ විතැන් වීමක් සිදු වේ.

4.3 වී අස්වැන්න සඳහා ඉල්ලුම් සහ සැපයුම් ශ්‍රිත පිළිවෙලින් සමීකරණ මගින් ලබා දී ඇත: Qd = 20 - 0.02p and Qs = - 12 + 0.06p. සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න.

සමතුලිත ලක්ෂයේදී. Qs = Qd

: - 12 + 0.06p = 20 – 0.02p

: 0.08p = 32

: p = Rs. 400

Qd = 20 – 0.02*400

= 12 *ඒකක*

05 ප්‍රශ්නය

5.1 කළමනාකරුවන් සහ නායකයින් අතර වෙනස්කම්

කළමනාකරුවන්	*නායකයින්*
යටත් නිලධාරීන් ඇත	*අනුගාමිකයින් ඇති*
ගෞරවය අපේක්ෂා කරයි	*ගෞරවය ලබයි*
කාර්යය නැඹුරු වේ	*පුද්ගල නැඹුරු වේ*
වර්තමානය ගැන අවධානය යොමු කරයි	*අනාගතය දෙස අවධානය යොමු කරයි*
යටත් නිලධාරීන් පාලනය කරයි	*අනුගාමිකයින් සවිබල ගන්වයි*

5.2 "බාහිර පරිසරයේ වෙනස්කම් වලට සංවිධාන අවදානමට ලක් වේ" සංවිධානයකට ඇති අවස්ථා සහ තර්ජන වල බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

මෙහිදී PESTEL සාධක ගැන සාකච්ඡා කළ යුතුය. PESTEL සාධකවල වෙනස්වීම් හේතුවෙන් ඇතිවිය හැකි අවස්ථා සහ තර්ජන පැහැදිලි කරන්න

5.3 කළමනාකරණ කුසලතා වල අවශ්‍යතාවය සංවිධානයක කළමනාකරණ මට්ටම් අනුව වෙනස් වේ. ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න

එකඟ වේ. සංකල්පීය කුසලතා, අන්තර් පුද්ගල කුසලතා සහ තාක්ෂණික කුසලතා ලෙස ප්‍රධාන වශයෙන් කළමනාකරණ කුසලතා තුනක් ඇත. ඉහළ කළමනාකාරීත්වයේ දී සංකල්පීය කුසලතා අනෙක් කුසලතා වලට වඩා වැදගත් වේ. පහළ කළමනාකාරීත්වයේ දී තාක්ෂණික කුසලතා අනෙකුත් කුසලතා වලට වඩා වැදගත් වේ. මධ්‍ය මට්ටමේ දී කළමනාකරණ කුසලතා තුනෙහිම සමබර බව වැදගත් වේ. සැලකියයුතු ලෙස අන්තර් පුද්ගල කුසලතා ඕනෑම කළමනාකරණ මට්ටමක් සඳහා එකසේ වැදගත් වේ.

06 ප්‍රශ්නය

6.1 සංවිධානයක "දැක්ම" නිර්වචනය කර දැක්මෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

සංවිධානයක දැක්ම අහසේ දිදුලන තාරකාවක් වැනිය, එය ලුහුබැඳීමක් මිස කිසිදා සාක්ෂාත් කරගත නොහැක. දැක්ම මගින් ඔවුන් යා යුතු ස්ථානය පිළිබඳ සංවිධානයට මඟ පෙන්වනු ඇත. දැක්ම මත පදනම්ව, සංවිධානයට ඔවුන්ගේ මෙහෙවර, ඉලක්ක සහ අරමුණු සංවර්ධනය කළ හැකිය.

6.2 "නායකයන් තම අනුගාමිකයින්ට බලපෑම් කිරීමට විවිධ බල මූලාශ්‍ර භාවිතා කරයි". එවැනි බල ප්‍රභවයන් කිහිපයක් පැහැදිලි කරන්න.

නායකයින්ට විවිධ බල ප්‍රභවයන් ඇත, ඒවා අනුගාමිකයින්ගේ හැසිරීමට බලපෑම් කිරීමට භාවිතා කළ හැකිය. පහත දැක්වෙන්නේ එවැනි බල ප්‍රභවයන් කිහිපයකි

නීත්‍යානුකූල බලය - තනතුරෙහි පිහිටීම මත ලැබෙන බලපෑම් කිරීමේ හැකියාව
ත්‍යාග/ප්‍රතිලාභ ලබා දීමේ බලය - ප්‍රතිලාභ හෝ දිරිගැන්වීම් වලට බලපෑම් කිරීමේ හැකියාව
බලහත්කාර බලය - තර්ජන හරහා බලපෑම් කිරීමේ හැකියාව
යොමු බලය - පුද්ගලික ගතිලක්ෂණ හරහා බලපෑම් කිරීමේ හැකියාව
විශේෂඥ බලය - අදාළ විෂය සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් තිබීම.

6.3 "සැලසුම් කිරීම සහ පාලනය කිරීම ඕනෑම සංවිධානයක අන්තර් සම්බන්ධිතය වේ" ඔබ එකඟ වේද? පැහැදිලි කරන්න.

එකඟ වේ, සැලසුම් කිරීමේ කාර්යය යනු සංවිධානය තම පරිසරය හොඳින් ඇගයීමෙන් පසු ඔවුන්ගේ දැක්ම, මෙහෙවර, ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ග සැකසීමයි. පාලනය කිරීමේ කාර්යය යනු සංවිධානයේ නියම ප්‍රතිඵලය සමඟ නියමිත ප්‍රමිතීන් සංසන්දනය කිරීමෙන් සංවිධානය ඇගයීම සහ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමයි. එබැවින් සැලසුම් කිරීමේ කාර්යය සහ පාලන කාර්යය එකිනෙකට සම්බන්ධ වේ.

***